# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1957/13 - 2016 මාර්තු මස 08 වැනි අඟහරුවාදා - 2016.03.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/10/23/2010

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.06.10 දිනැති හා අංක 1709/47 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.06.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ගෝනවල (බ.ප), තල්වත්ත, අංක 59 හි පදිංචි ඒ. ඒ. ඩී. ඩී. චන්ද්‍රසිරි මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, අංක 34 හි පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2015.04.30 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 මාර්තු මස 01 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/10/23/2010

කාර්මික අධිකරණයේ දී ය.

ඒ. ඒ. ඩී. ඩී. චන්ද්‍රසිරි,
අංක 59, තල්වත්ත, ගෝනවල (බ.ප),
සහ

නඩු අංකය : ඒ 3385 — ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

අතර කාර්මික ආරාවුල

ප්‍රදානයයි

1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත්වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් 2011.06.03 දාතමින්, ඉහත පාර්ශවයන් අතර වූ කාර්මික ආරාවුල බේරුම් කිරීම සඳහා මාවෙත යොමු කරන ලදී. ඒ අනුව නඩුව විභාගයට ගන්නා ලද අතර, පළමු පාර්ශවය වෙනුවෙන් ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් ඒ1, ඒ2, ඒ2ඒ, ඒ3, ඒ4, ඒ5, ඒ6, ඒ7, ඒ7ඒ, ඒ7බී, ඒ8, ඒ9, ඒ10, ඒ11(1) සිට 11(7), ඒ10, ඒ10ඒ, ඒ12 සිට ඒ 22 යන ලේඛන ලකුණු කර ඉදිරිපත් කරන ලදී. දෙවන පාර්ශ්වය වූ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙනුවෙන් සාක්ෂි දෙන ලද්දේ, එහි මානව සම්පත් කළමනාකාරිනියයි. එම පාර්ශ්වය ආර්1, ආර්1ඒ, ආර්2ඒ, සිට ආර්2 එෆ් දක්වා ද, ආර්3, ආර්3ඒ, ආර්4, ආර්5, ආර්5ඒ, ආර්6 යන ලේඛන ලකුණු කළේය. අනතුරුව දෙපාර්ශ්වය විසින් ලිඛිත දේශනද ගොනු කරන ලදී.

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහකාර ගණකාධිකාරීවරයෙකු ලෙස සේවය කර විශ්‍රාම ලබා සිටින ඉල්ලුම්කාර ඒ. ඒ. ඩී. ඩී. චන්ද්‍රසිරි යන අයගේ ඉල්ලීම වී ඇත්තේ කළමනාකරණ චක්‍ර ලේඛ අංක 30(1) 2006 අනුව වැටුප් පරිවර්තනය කිරීමේදී ලැබිය යුතු වැටුප් වර්ධක 20 වෙනුවට වැටුප් වර්ධක 18 ක් පමණක් ලබා දීමෙන් අසාධාරණයක් සිදුවී ඇති බවත්, එකී වැටුප් වර්ධක හා ඒ අනුව ලැබිය යුතු හිඟ වැටුප් ලබාදෙන ලෙසත් ය.

රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවක වැටුප් ප්‍රතිශෝධනය කිරීම සඳහාවූ කළමනාකාර චක්‍රලේඛ අංක 30 චක්‍ර ලේඛය නිකුත් කරන විට



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉල්ලුම්කරු සහකාර ගණකාධිකාරී (vi ශ්‍රේණියේ) තනතුරු දරූ බව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පිළිගත් කරුණක් විය. ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් අදාළ චක්‍රලේඛය ''ඒ5'' ලෙස ලකුණු කර ඉදිරිපත් කළ අතර, එකී චක්‍රලේඛය අනුව වැටුප සංශෝධනය කරන ලද ආකාරය ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නියෝග සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) 2007.03.30 දාතමින් ලිපියකින් දනුම් දුන් බවයි. එකී ලිපිය ''ඒ6'' ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. ''ඒ6'' ලේඛනයේ දක්වෙන වැටුප් සංශෝධනයට එකඟ නොවූ ඉල්ලුම්කරු 2007.05.10 දින ලිපියක් මගින් එකී සංශෝධනය ''ඒ5'' ලෙස ලකුණු කළ චක්‍ර ලේඛයට අනුකූලව සිදුකර නොමැති බවට අධිකාරියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත්) දනුම් දී ඇත. එම ලිපිය නඩු විභාගයේ දී ''ඒ7'' ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කළ ආකාරයට එම ලිපියට පිළිතුරක් නොලැබුණු නිසා 2007.07.02 දාතමින් ද, 2007.07.31 දාතමින්ද, සිහිකැඳවීම් ලිපි දෙකක් යවා ඇත.2007.10.04 දින අධිකාරිය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) ඉල්ලුම්කරුට ලිපියක් එවමින් ප්‍රකාශ කර ඇත්තේ ''කළමනාකරණ සේවා චක්‍රලේඛන 30 යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවකයින්ගේ වැටුප් සංශෝධනය කිරීමේදී වැටුප් විෂමතාවයක් පැනනැගි ඇති බවත්, එම වැටුප් විෂමතාවයන් ඉවත් කිරීම සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කිරීමට කටයුතු කරගෙන යන බවත්ය. එකී ලිපිය ''ඒ8'' ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඉල්ලුම්කරු ප්‍රකාශ කරන පරිදි නිවාස සංවර්ධන අධිකාරිය චක්‍ර ලේඛ අංක 30 අනුව සිය වැටුප නිසිලෙස සකස් නොකරන ලද හෙයින්, වැටුප් වර්ධක හා හිඟ වැටුප් ලබාදීමට මැදිහත්වන ලෙස සහකාර කම්කරු කොමසාරිස් (දකුණු කොළඹ) වෙත ඉල්ලීමක් කර ඇත. එසේ ඉල්ලීමක් කරන ලද ලිපිය ''ඒ9'' ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. සහකාර කම්කරු කොමසාරිස් (දකුණු කොළඹ) ජාතික නිවාස සංවර්ධන අධිකාරියටද දනුම් දී ඒ පිළිබඳ පරීක්ෂණයක් පවත්වා ඇත. කම්කරු කොමසාරිස්වරයාගේ නිර්දේශ 2010.08.31 දාතමින් නිවාස සංවර්ධන අධිකාරිය වෙත දනුම් දී ඇත. (ඒ10) එම ලේඛනයේ සඳහන් වන්නේ,

''චන්ද්‍රසිරි මහතාගේ වැටුප් පරිවර්තනය කිරීමට අදාළවූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2006/6 කළමනාකරණ චක්‍රලේඛ 30, 30(1) සහ 35 යන චක්‍රලේඛ අභිබවා ක්‍රියාකර ඇති බව හා එම චක්‍රලේඛ මගින් ලබාදී ඇති උපදෙස් නිසි පරිදි අනුගමනය කර නොමැති'' බවයි. ඉල්ලුම්කරුගේ වැටුප පරිවර්තනය කළයුතු ආකාරයද එම ලේඛනයේ දක්වා ඇත. තවද, එහි වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ ''උක්ත චක්‍රලේඛය අනුව චන්ද්‍රසිරි මහතාට හිමි වැටුප පියවරේ උපරිමයට ඔහු පැමිණ නැති බැවින්, වැටුප් වර්ධක අමුණා තැබීම නීත්‍යානුකූල නොවන'' බවයි.

මෙම නඩු විභාගයේ දී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙනුවෙන් එහි මානව සම්පත් කළමනාකාරිනිය සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේ, කළමණාකාරණ චක්‍රලේඛ 30 හි දී ඇති උපදෙස් අනුව එක් එක් සේවාවන් වර්ගීකරණය කර ඒ වර්ගීකරණයට අනුව වටුප් කාණ්ඩ හඳුන්වා දී ඇති බවය. ඒ අනුව ඉල්ලුම්කරු දරූ සහකාර ගණකාධිකාරී තනතුර එම්. ඒ 5 - 2 වැටුප් කාණ්ඩයට වැටෙන බවත්, ඉල්ලුම්කරුගේ වැටුප සකස් කරන ලද්දේ ඒ අනුව බවත් ය. අංක 30 චක්‍රලේඛයට අදාළ විස්තරාත්මක ලේඛනයක් ''ආර්2'' ලෙස සිය සාක්ෂියේදී ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම ලේඛනයට අනුව ඉල්ලුම්කරුට අදාළ

83 Assistant Accountant vi M. A. - 5 - 2

Appropiriate Salary Step - 17695 දරන කොටස ''ආර්2(ඒ)'' ලෙස ලකුණු කරන ලදී. සාක්ෂිකාරිය වැඩිදුරටත් සඳහන් කළේ, වැටුප් සංශෝධනය කරන අවස්ථාවේ යම්කිසි සේවකයෙකු උපරිමය අභිබවා වැටුප් වර්ධක ලබා තිබුණහොත්, නව වැටුප් පරිමාණය උපරිමය අභිබවා වැටුප් වර්ධක ලබාදී ඔහුගේ වැටුප් වර්ධක එම පරිමාණයේ අහුරා තබන ලෙස චක්‍ර ලේඛයේ සඳහන්ව ඇති බවත්, අදාළ වගුව අනුව ඉල්ලුම්කරු උපරිමය ඉක්මවා වැටුප් ලබා ඇති බවත් ය.

තවද, දෙවන පාර්ශ්වය සිය සාක්ෂියේ දී ''ආර්2'' ලෙස ලකුණු කළ චක්‍රලේඛයට අදාළ ''ආර්2ඒ'', ''ආර්2බී'', ''ආර්2සී'' යන ලේඛන එම චක්‍රලේඛයට අදාළ ලේඛන නොවන බවට ඉල්ලුම්කාර පාර්ශ්වය ප්‍රකාශ කර සිටියේ ය. දෙවන පාර්ශ්වය නැවත එකී චක්‍රලේඛනය ''ආර්6'' ලෙස ලකුණු කළ අතර, ඊට අදාළ ඇමුණුම් ලෙස ''ආර්17'' සිට ''ආර්22'' දක්වා ලේඛන ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එකී ලේඛනද අදාළ චක්‍රලේඛයට අදාළ ලේඛන නොවන බවට ඉල්ලුම්කාර පාර්ශ්වය තර්ක කළේය. දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද සමහර ලේඛන පිළිබඳව අධිකරණය සෑහීමට පත් නොවන බව මෙහිදී සඳහන් කළ යුතුවේ.

දෙපාර්ශ්වයේ සාක්ෂි අනුව පෙනී යන්නේ අංක 30 චක්‍රලේඛ පදනම් කරගෙන වැටුප් පරිවර්තනය කිරීම සම්බන්ධයෙන් එකිනෙකට වෙනස් ස්ථාවරයන් මත කටයුතු කර ඇති බවයි. කළමනාකරණ චක්‍රලේඛ අංක 30 චක්‍ර ලේඛයේ අංක 8 යටතේ සඳහන් වන්නේ මෙම වැටුප් පරිවර්තනය සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කර ගැනීම් විස්තර විමසීම් හෝ වැඩිදුර උපදෙස් සඳහා වන සියලු ඉල්ලීම් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලේකම් වෙත යොමු කළ යුතු බවයි. තවද, කළමනාකරණ චක්‍රලේඛ ඇමුණුම් 11 කරුණු අංක 4 යටතේ අනුකූලතා සහතිකයක් පිළිබඳ සඳහනක් ඇත. එය මෙසේ ය.

''මෙම චක්‍රලේඛයේ සඳහන් ආකාරයෙන් වර්තමාන සේවා ගණයක් හා තනතුරු නව වැටුප් ව්‍යුහය තුළ පිහිටුවීමෙන් පසු ක්‍රියාත්මක කිරීමට පෙර එම අන්තර්ග්‍රහණය නිවැරදිව සිදුකර ඇති බවට අනුකූලතා සහතිකයක් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙතින් අනිවාර්යයෙන් ලබාගත යුතු වේ.''

නිවාස සංවර්ධන අධිකාරිය වෙනුවෙන් සාක්ෂි දුන් මානව සම්පත් කළමනාකාරිණිය, කළමනාකරණ සේවා චක්‍ර ලේඛයේ සඳහන් අනුකූලතා සහතිකයක් ලබාගත යුතු බව සඳහන් වන කොටස ''ආර්2ඩී'' වශයෙන් ද ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එසේ වුවද සාක්ෂිකාරිය සිය සාක්ෂියේදී ප්‍රකාශ කළේ, වැටුප් ගණනය කිරීම නිවැරදිද යන්න විමසා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට ලිපියක් යවන ලද බවත්, ඊට පිළිතුරක් නොලැබුණු නිසා, සිහිකැඳවීමක් කරන ලද බවත්, ඊට ද පිළිතුරක් නොලැබුණ බවත් ය. එම සාක්ෂියේදී, එසේ ලියුම් යවන ලද බව සනාථ කරන ලේඛනයක් ඉදිරිපත් කිරීමටද අසමත් වුවාය. ඒ අනුව වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් අනිවාර්යයෙන් ලබා ගතයුතු බව දක්වෙන අනුකූලතා සහතිකය ලබාගෙන නොමැති බව පැහැදිලි කරුණකි.

සිය වැටුප සකස් කිරීමේදී අසාධාරණයක් සිදුවී ඇති බවට ඉල්ලුම්කරු විසින් සහකාර කම්කරු කොමසාරිස් (දකුණු කොළඹ)

වෙත කරන ලද ඉල්ලීම ඉල්ලුම්කරු සිය සාක්ෂියේදී ''ඒ9'' ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. සහකාර කම්කරු කොමසාරිස්වරයා, නිවාස සංවර්ධන අධිකාරියටද දන්වා පරීක්ෂණයක් පවත්වා නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කර ඇත. 2010.08.31 දින කරන ලද නිර්දේශ ඉල්ලුම්කරු විසින් ''ඒ10'' වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරන ලදී. කම්කරු කොමසාරිස්වරයාගේ නිර්දේශ සහිත ලිපියේ දැක්වෙන්නේ, නිවාස සංවර්ධන අධිකාරිය, ඉල්ලුම්කරුගේ වැටුප පරිවර්තනය කිරීමට අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2006 - 6 කළමනාකරණ චක්‍රලේඛ 30, 30(1) හා 35 චක්‍රලේඛ අභිබවා ක්‍රියාකර ඇති බවයි. එම චක්‍රලේඛ මගින් ලබාදී ඇති උපදෙස් නිසි පරිදි අනුගමනය කර නොමැති බවයි. එසේම එම ලේඛනයේ ඉල්ලුම්කරුගේ වැටුප් වර්ධකය ලබාදිය යුතු ආකාරයද දක්වා ඇත. ඉල්ලුම්කරු කාර්මික අධිකරණයට මෙම ආරවුල යොමුකර ඇත්තේ, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, කම්කරු කොමසාරිස්ගේද නිර්දේශ ක්‍රියාත්මක කර නොමැති නිසාය.

ජාතික වැටුප් හා සේවක කොමිෂන් සභාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරි වෙත එවන ලද ඉල්ලුම්කරුගේ වැටුප් පරිවර්තනය කිරීමට අදාළ ලිපියක් නිවාස සංවර්ධන අධිකාරිය විසින ''ආර්3'' ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම ලිපිය එවා ඇත්තේ 2011.09.27 දාතමිනි. තවද, එම ලිපියේ සඳහන් වන්නේ ''ඔබේ අංක 3/2/3/10/2/70 හා 2011.06.16 හා 2010.11.08 දිනයන් දරන ලිපි හා බැඳේ'' යනුවෙනි. එයින් පැහැදිලි වන්නේ නිවාස අධිකරිය ජාතික වැටුප් හා සේවක කොමිසන් සභාව වෙත ලිපියක් යොමුකර ඇත්තේ, කම්කරු කොමසාරිස්වරයා සිය නිර්දේශ ඉදිරිපත් කළාට පසුව බවය. එසේම ''ආර්3(ඒ)'' හා ''ආර්3(බී)'' ලේඛන වලින්ද ඒ බව පැහැදිලි වේ. එසේම ''ආර්3'' ලේඛනයේ කලින් සඳහන් කරන ලද අනුකූලතා සහතිකයක් හැටියට සැලකිය නොහැකිය.

කළමනාකරණ චක්‍රලේඛ අංක 30 නිකුත් කිරීමෙන් පසු ඒ අනුව වැටුප් සකස් කිරීමේදී, විෂමතාවයක් පැනනැගී ඇති බව නිවාස සංවර්ධන අධිකාරිය ඉල්ලුම්කරුට දැනුම් දී ඇත්තේ 2007.10.04 වන දින දීය. ''ඒ8'' ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද කම්කරු කොමසාරිස්වරයාගේ නිර්දේශ සඳහන් ලිපිය නිකුත් කර ඇත්තේ 2010.08.31 වන දිනදීය. 2007.10.04 දින සිට 2010.08.31 දක්වා වසර දෙකහමාරකට අධික කාලයක් ගතවී ඇත. වැටුප් සකස් කිරීමේදී පැනනැගී ඇතැයි කියූ විෂමතාවයන් සම්බන්ධයෙන් එම කාලය තුළ දෙවන පාර්ශ්වය කිසියම් හෝ ක්‍රියා මාර්ගයක් ගත් බව සනාථ කරන සාක්ෂි හෝ ලේඛන මෙම විභාගයේදී ඉදිරිපත් කළේ නැත. කලින් සඳහන් කළ පරිදි වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇත්තේ, කම්කරු කොමසාරිස්වරයාගේ නිර්දේශ වලින් පසුවය. තවද, කම්කරු කොමසාරිස්වරයා සිය නිර්දේශ සහිතව 2010.08.31 දින දෙවන පාර්ශ්වය වෙත යවන ලද ලිපියෙහි අවසානයේ සඳහන් කර ඇත්තේ, ''එම නිර්දේශවලට විරෝධතා ඇත්නම් දින 14 ක් ඇතුළත ඉදිරිපත් කරන ලෙසය''. දෙවන පාර්ශ්වය විසින් 2010.09.30 වන දින, එනම්, කම්කරු කොමසාරිස්වරයාගේ නිර්දේශ සහිත ලිපියට මසකට පමණ පසුව කම්කරු කොමසාරිස්වරයා වෙත යවන ලද ලිපියක් ''ආර්3(සී)'' ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එම ලිපියේ දැක්වෙන්නේ, ඉල්ලුම්කරුගේ වැටුප සකස් කළ ආකාරයයි.

ඉල්ලුම්කරුගේ වැටුප සකස් කිරීම සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වකාර නිවාස සංවර්ධන අධිකාරිය නිසි උනන්දුවකින් කටයුතු කර නොමැති බවයි. කළමණාකාර අංක 30 චක්‍රලේඛ ප්‍රකාරව අනුකූලතා සහතිකයක් ලබාගෙන නොමැති බවත් ය.

ඉහත සඳහන් කරන ලද කරුණු සියල්ල සැලකිල්ලට ගෙන මා තීරණය කරන්නේ, ඉල්ලුම්කරුගේ වැටුප නිසිලෙස සකස් කිරීමට දෙවන පාර්ශ්වය අපොහොසත්වීමෙන්, අයුක්තියක් සහ අසාධාරණයක් සිදුවී ඇති බවයි. ඒ අනුව ඉල්ලුම්කරු විසින් ''ඒ11'' දරන ලේඛනයේ දැක්වෙන පරිදි රුපියල් එක් ලක්ෂ එක් දහස් හාරසිය අසූ පහක් (1,01,485/-) ක හිඟ වැටුප් මුදලක් දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කරුට ගෙවිය යුතු බවට තීරණය කරමි. එම හිඟ වැටුපට අදාළව අර්ථ සාධක අරමුදලටද, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලටද දෙවන පාර්ශ්වය විසින් ගෙවිය යුතු මුදලද ගෙවිය යුතු බවට තීරණය කරමි. තවද, මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පළවී මසක් ඇතුළත ක්‍රියාත්මක විය යුතු බවටද තීරණය කරමි.

නීතිඥ සරත් ලියනගේ,
බේරුම්කරු.

2015.04.30 දින,
කාර්මික අධිකරණයේ දී ය.

03 - 582

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.